රනිල් වික්‍රමසිංහ

# දේශපාලනය සහ ධර්මය

# දේශපාලනය සහ ධර්මය

රනිල් වික්‍රමසිංහ

සරසවි ප්‍රකාශකයෝ
30 ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

| | |
|---|---|
| පරි. අංක | [illegible] |
| වර්ග අංක | 294.3562 |
| දිනය | |


දේශපාලනය සහ ධර්මය


ප්‍රථම මුද්‍රණය 2005 මැයි
දෙවන මුද්‍රණය 2005 ඔක්තෝම්බර්


© සරසවි ප්‍රකාශකයෝ


ISBN 955-573-378-3

පරිගණක අක්ෂර සංයෝජනය - උමානි ෆොන්සේකා

පිටකවරය සහ රූ රටා - සමනල අතාවුදහෙට්ටි

මුද්‍රණය - සිකුරු ප්‍රකාශකයෝ
144 වෙනිවැල්කොළ
පොල්ගස්ඕවිට



ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



නව යුගයේ ලක්ෂණ බුදුන්වහන්සේගේ
ධර්මයට පටහැනි නැත.
මේ ලක්ෂණ හේතු කොට ගෙන ඇතිවන
ගැටලුවලට ද විසඳුම්
බුදුන්වහන්සේගේ දේශනා වල දැක්වේ.
උන් වහන්සේ දේශනා කළ කරුණු නව
තත්ත්වයන් සමග එකතු කරගත් කල්හි
නූතන යුගයේ ලක්ෂණ වලට අලුත්
අර්ථකථනයක් සැපයීමට අපට හැකි වේ.
වර්තමාන යුගයේ ගති ලක්ෂණ
හේතු කොට ගෙන
පැන නැගී ඇති ගැටලු වලට
විසඳුම් සෙවීම පිළිබඳ උනන්දුවක්
අද යුරෝපයේ ද ඇමරිකාවේ ද පවතී.
එබැවින් 21 වැනි සියවසට ඔබින දර්ශනය
බුදු දහම බව ලෝකයට පෙන්වා දීමට අපට
හැකි වේ.

ෆ්‍රෙඩ්රික් නියුමාන් පදනම ලෝකය පුරා නිදහස් චින්තනය ප්‍රවර්ධනය කිරීමට මෙන්ම පෞද්ගලික, පොදු හා සමාජ ජීවිතයන්ගේ සියලුම අංශයන් තුළ 'නිදහස' සහ 'වගකීම' යථාර්ථයක් බවට පත්කිරීම සඳහා ප්‍රයත්නයක යෙදෙයි. නිදහස හා වගකීම නිදහස් චින්තනයේ මූලධර්මයන්ය.

ශත වර්ෂ ගණනාවකට ඉහතදී බුදුරජාණන් වහන්සේ පුද්ගල නිදහස පිළිබඳ දේශනා කළ අතර තමන්ගේ ක්‍රියාවන් පිළිබඳව වගකීම භාර ගැනීම උදෙසා ජනතාව දිරිගැන්වූ සේක. අද අප නිදහස් චින්තනය ලෙස පිළිගන්නා අන් අදහස් ඉවසීම, මානව හිමිකම්, මූලික මිනිස් අයිතිවාසිකම්, සමාන අවස්ථා, නිවැරදි තරගකාරීත්වය සහ බහුවාර්ගිකත්වය පිළිබඳව බුදුන් වහන්සේ දේශනා කර ඇත්තේ මීට වසර දෙදහස් පන්සියයකටත් පෙරදීය.

එනයින් බලන කල මෙම පොත් පිංචෙහි අන්තර්ගතය නිදහස් චින්තනයේ මූලධර්ම සමග ඍජු සබඳතාවක් පෙන්නුම් කරයි. නිදහස් චින්තනය තුළ නිදහස අර්ථ දක්වෙන්නේ නිර්මාණාත්මක පුද්ගලයා යන සංකල්පය පදනම් කර ගනිමිනි. එසේ හෙයින් 'දේශපාලනය සහ ධර්මය' කෘතිය මුද්‍රණය කර බෙදා හැරීම සඳහා ෆ්‍රෙඩ්රික් නියුමාන් පදනම සම්බන්ධ වනුයේ අතිශය තෘප්තිකර හැඟීමෙනි.

# පෙරවදන

දේශපාලනය සහ ධර්මය යන වචන දෙක අපේ රටේ ඉතාමත් ප්‍රකට වචන දෙකකි. අපේ රටේ පමණක් නොව ලෝකයේ දියුණුවක් ලබා ඇති බොහෝ රටවල මේ හා සමාන තේරුම් ඇති වචන වඩාත් ප්‍රසිද්ධියට පත්ව තිබේ. මේ වචන දෙකින් දේශපාලන යන වචනයට වඩා ධර්මය යන වචනය දිගු අතීතයකට සම්බන්ධ වෙයි.

ධම්ම යන සංකල්පය විවරණය කිරීම සඳහා පෙර'පර දෙදිග වියත්හු මහත් පරිශ්‍රමයක් දැරූහ. රොබොටේ සී චෛල්ඩර්ස් ඔහුගේ පාලි භාෂා ශබ්දකෝෂයෙහි ධම්ම යන පදය විවිධාර්ථ විසි ගණනකට පරිවර්තනය කොට දක්වා ඇත. ස්වභාවය, තත්ත්වය, වස්තුව, ලක්‍ෂණය, භාවිතය, යුතුකම, අදහස, ධර්මය, නීතිය, සද්ගුණය, යුක්තිය, බුදුන්ගේ ධර්මය, ආගම යන විවිධාර්ථ සූචනය කරන බව එහි සඳහන් වේ. රිස් ඩේවිඩ්ස් මැතිණිය එක් අවස්ථාකදී ධම්ම යනු සදාචාරය විය හැකි බව සඳහන් කළාය. ධම්ම යන වචනය විවරණය කරමින් එනමින්ම වටිනා ග්‍රන්ථයක් ජෝන් රෝස් කාටර් මහාචාර්යතුමා විසින් සම්පාදනය කොට තිබේ.

දේශපාලනයෙහි අත්තිවාරම සමාජය නිසි පරිදි සකස් කිරීමට ඇති ආශාව බව ලන්ඩන් විශ්ව විද්‍යාලයේ අර්ථශාස්ත්‍රය පිළිබඳ ආචාර්ය බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ ආර්ථික උපදේශක මණ්ඩලයේ සාමාජික ජී.ඩී.එච්. කෝල් මහතා කියයි. දේශපාලනය පිළිබඳ චින්තකයාගේ බලාපොරොත්තුව ශිෂ්ට ජීවිතය දියුණු කිරීම සහ පැවැත්වීම බවත්, දේශපාලන කරුණු මනුෂ්‍ය ජීවිතයේ බාහිර වූද, අධ්‍යාත්මික වූද, දියුණුවටත් යහපතටත් අදාළ දේ බවත් විලයිල් බර්න්ස් මහතා කියයි. දේශපාලනයේ පරමාර්ථය නම් විශාලම පිරිසකට උසස්ම යහපත

සැලැස්වීම බව ඇරිස්ටෝටල් පඬිතුමා කියා ඇත. මහජනයාගේ මෙලෝ පරලෝ දෙකෙහිම යහපත පිණිස වුවමනා කරන ඉගෙනීම, සනීපාරක්ෂාව, චරිත වර්ධනය, ආර්ථික තත්ත්වය ආදී දේවල් නිසි පරිදි දියුණු කිරීම දේශපාලනය වශයෙන් කෙටියෙන් සඳහන් කළ හැකිය.

ඉහත සඳහන් විවරණය දෙස බලන විට දේශපාලනයත් ධර්මයත් එකම මගක ගමන් කළ හැකි බවත්, එසේ ගමන් කිරීමෙන් ඉමහත් ප්‍රතිඵල ලැබිය හැකි බවත් පැහැදිලි වෙයි.

දේශපාලනය සහ ධර්මය නම් මෙම කුඩා කෘතිය ලිපි හතරකින් යුක්තය. ප්‍රථම ලිපියෙන් චින්තන විප්ලවයක් සහ සමාජ විප්ලවයක් කළ මෙතෙක් ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම විප්ලවවාදියා ගෞතම බුදුන් වහන්සේ බව කියා ඇත. බුදුරජාණන් වහන්සේ විසින් කළ එම විප්ලවය පසු කාලයේ යුරෝපයේ ඇති වූ ප්‍රංශ විප්ලවය, රුසියන් විප්ලවය වැනි ඒවා නොවේ. දස දහස් ගණන් මිනිසුන්ගේ ජීවිත විනාශ කරමින්, ලේ ගංගා වල පීනමින්, හිංසාවෙන් පීඩාවෙන් පිරීගිය එම විප්ලවයන්ගෙන් ඉතිරි වූයේ වෛරය සහ පළිගැනීම වැනි අතිශයින්ම භයානක සිතිවිලි පරම්පරාවක් පමණි. බුදුරජාණන් වහන්සේගේ විප්ලවය වූ කලී හුදෙක් මහා කරුණාව සහ ප්‍රඥාව මුල්කොට සිදු වූවක් විය. එම විප්ලවයේ ප්‍රතිඵල වශයෙන් පෙරදිග රටවල මෙන්ම අපරදිග රටවලත් කෝටි සංඛ්‍යාත ජනතාවක් විමුක්ති සුවය සොයමින් සහ විඳිමින් සිටිති. කලක් මහා සටනක් කොට එහි අනිටු විපාක සියැසින් දුටු අශෝක වැනි ප්‍රතාපවත් නරපතියෙකු පූර්ණ අහිංසාවාදියෙකු වූයේ බුදුන් වහන්සේ විසින් කරන ලද ඒ මහා විප්ලවයේ ප්‍රතිඵල වශයෙනි. යම්කිසි රටක සමාජ විප්ලවය අහිංසක ලෙස කිරීමට සූදානම් වන දේශපාලඥයෙකු හෝ නායකයකු විසින් මේ තත්ත්වය මැනවින් තේරුම් ගතයුතු වන්නේය.

මිනිස් අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදය, මානව නිදහස පිළිබඳ මුළු මහත් ලෝකයටම විශිෂ්ට පාඩම් උගන්වා ඇත්තේ බුදුරජාණන් වහන්සේය. බුදුරජාණන් වහන්සේ විසින් අනුදක්නා ලද සිතීමේ නිදහස වැනි දෙයක් ආගම් පිළිබඳ ඉතිහාසයෙහි අන් කිසිම තැනක දක්නට නොලැබේ. තමාම සත්‍ය අවබෝධ කර ගැනීමෙන් මිස දෙවියෙකු විසින් හෝ අන් කවරකු විසින් හෝ පිරිනමන දයාමය

ආශිර්වාදයක පිහිටෙන් මිනිසෙකුට දුකින් මිදිය නොහැකි බව පැහැදිලිවම පෙන්වා දුන්හ. කලින් අසා ඇති නිසාවත්, පාරම්පරික චාරිත්‍ර වශයෙන් ආ නිසාවත්, ඉතිහාසයෙහි සඳහන්ව ඇති නිසාවත්, පිටක වල ඇති නිසාවත්, තර්කයට හා න්‍යායට ගැළපෙන නිසාවත්, විචාරයට හසුවන නිසාවත්, තමන් පිළිගත් මතයට අනුකූල නිසාවත්, කෙනෙකුගේ දක්ෂතාවය නිසාවත්, හෙතෙම අපගේ ආචාර්යවරයා කියාවත් යමක් පිළිගත යුතු නොවේ. තමන්ගේ බුද්ධියෙන් විමසා බලා සත්‍ය යැයි තමන්ට වැටහෙතොත් පමණක් පිළිගත යුතුයැයි කාලාම සූත්‍රයේ උගන්වා ඇත. යහපත් සමාජ වෙනසක් ගැන හිතන කියන ඕනෑම පුද්ගලයෙකුට මෙය ඉහළම මාතෘකා පාඨය වශයෙන් ගැනීම සුදුසු වන්නේය.

ධර්මාශෝක අධිරාජ්‍යයාගේ පුත් මිහිඳු මහරහතන් වහන්සේ විසින් ක්‍රි.පූ. තුන්වන ශතවර්ෂයේදී මේ ශ්‍රී ලංකාද්වීපයට බුද්ධාගම ගෙන එන ලදී. උන් වහන්සේ විසින් ගෙන ආවේ බුද්ධ ධර්මය පමණක් නොවේ. එකල උසස් තත්ත්වයක පැවති සම්පූර්ණ බෞද්ධ සංස්කෘතියම මෙරටට ගෙන එන ලදී.

මිහිඳු හිමියන් ශ්‍රී ලංකාවට වැඩමවන විට ශ්‍රී ලංකාව එතරම් දියුණු තත්ත්වයක නොපැවැත්තේය. සිංහලයා ජාතියක් හැටියට දියුණු වන්නට පටන් ගත්තේ බුද්ධාගම වැළඳ ගැනීමෙන් පසුවයි. බුද්ධාගම සිංහල දේශයේත්, සිංහල ජාතියේත් උරුමයක් හැටියට ජාතික ආගම හැටියට දිවයිනෙහි ස්ථිරවම, සදහටම පිහිටුවීම මිහිඳු හිමියන්ගේ අදහස වූ බව ඉතිහාසයෙන් පෙනෙයි. බටහිර ධර්ම ප්‍රචාරකයන් මෙන් ආගමේ අයිතියත්, බලයත් රටවැසියන්ට නොදී තමන් අතෙහිම තබා ගැනීම මිහිඳු හිමියන්ගේ අදහස නොවීය.

ශ්‍රී ලංකාව පිරිසිදු ථෙරවාද බෞද්ධ රටකි. ශ්‍රී ලංකාවෙන් ලෝකයට ප්‍රදානය කළ ශ්‍රේෂ්ඨතම වස්තුව වූයේ උතුම් බුද්ධ ධර්මයයි. විසි එක්වැනි ශතවර්ෂයේ මුළුමහත් ලෝකය තුළ හටගෙන තිබෙන සියලුම ගැටලු වලට විසඳුම් බුදුදහම මගින් ලබාගත හැකිය. විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුව මුල්කොට දියුණුවේ හිනිපෙත්තට ගමන් කොට ඇති රටවල් ගණනාවක් ඔවුන්ගේ බල තුලනය කිරීමෙහි සහ, න්‍යෂ්ටික තර්ජන වල දිගින් දිගටම යෙදී සිටිති. ආයුධ වල බලය තුළින් හටගන්නේ සාමය නොව බියකි. භය ඇති තැනක ස්ථිර

සාමයක් කිසිවිටෙකත් ඇතිවිය නොහැකිය. ඒ තුළින් ව්‍යාප්ත වන්නේ වෛරය, අප්‍රසාදය හා විරෝධයයි. අවංකවූත්, ස්ථිරවූත් සාමය පැවතිය හැක්කේ බිය සැක ආදී අනතුරු වලින් තොර, අවංක විශ්වාසය ගොඩනැගීමට හේතුවන මෛත්‍රී සහගත පිරිසිදු වාතාවරණයක් තුළ පමණි. බුද්ධ ධර්මයෙන් බලාපොරොත්තු වන්නේ ඔවුනොවුන් මරා නොගන්නා සටන් නැති සමාජයක් ගොඩනැගීමටයි. ජය පරාජය දෙකම නැති එම සමාජයෙහි රජ කරන්නේ සාමයයි. ආත්මාර්ථකාමී ගතියෙන්, වෛරයෙන් හිංසාකාරී ක්‍රියාවන්ගෙන් තොරවූ අවිහිංසාවෙන්, සාමයෙන්, කරුණාවෙන්, මෛත්‍රියෙන්, සත්‍යයෙන් හා ප්‍රඥාවෙන් යුක්ත වූ බුද්ධ මාර්ගයම සියලුම අවුල් විසඳීමට සමර්ථ වන්නේය.

දේශපාලනඥයෙකුට ලේඛකයෙකු විය හැකිද? ලේඛකයෙකු වීම දේශපාලඥයෙකු වීම තරම් පහසු නොවේ. විරුද්ධ පක්ෂයේ නායක හා එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මහතා පළපුරුදු දේශපාලනඥයෙකි. ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයේ විවිධ තනතුරු ඉසුලූ කෘතහස්ත දේශපාලනඥයෙකි. එතුමා විසින් බුදුදහම ආරම්භයේ සිට එයින් ඇති වූ විවිධ සමාජ වෙනස්කම් සහ බලපෑම් පිළිබඳවත්, මිනිස් අයිතිවාසිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳවත් ලියන ලද විශේෂ ලිපි හතරක් ගොනුකොට සම්පාදනය කරන ලද 'දේශපාලන හා ධර්මය' යන කුඩා කෘතිය අගය කරමි.

ආචාර්ය ඉත්තෑපාන ධම්මාලංකාර
අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

2005 වෙසක් මස

# පටුන


ශ්‍රේෂ්ඨතම විප්ලවවාදියා බුදුන් වහන්සේය 01

බෝ රැක මුලින් ඇරඹුණු නවීකරණය 07

තෙරුන් වහන්සේලාගේ ජනතාවාදී ධර්මය 21

දේශපාලනය සහ ධර්මය 37